# II - කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 ට පිළිතුරු සපයන්න.**

01. i. පහත සඳහන් මූලාශ්‍ර අතරින් පුරා විද්‍යාත්මක මූලාශ්‍ර වලට අයත් වන මූලාශ්‍ර වර්ග 4 ක් තෝරන්න.

A පැරණි පොත්පත්

B ගොඩනැගිලි

C ජනකතා

D පැරණි භාණ්ඩ

E මිනිස් ඇට සැකිලි

F මිනිසා ආහාරයට ගෙන ඉතිරි වූ දෑ (ල.4)

ii. පහත සඳහන් ඓතිහාසික සිදුවීම් සිදු වූ කාලයන් ක්‍රි: වර්ෂ වලින් ලබා දී ඇත. ඒවාට අදාල වර්ෂ වරහන් තුළින් තෝරා බු: වර්ෂ වලින් ලියන්න.

(බු.ව. 818, බු:ව. 622, බු.ව. 511, බු.ව. 2492)

| | සිදුවීම | ක්‍රි : ව: | බු. ව. |
|---|---|---|---|
| **A** | මහසෙන් රජුගේ රාජ්‍ය කාලය ආරම්භවීම | ක්‍රි : ව: 274 | ........................... |
| **B** | වසභ රජුගේ රාජ්‍ය කාලය ආරම්භවීම | ක්‍රි : ව: 67 | ........................... |
| **C** | ශ්‍රී ලංකාවට නිදහස ලැබීම | ක්‍රි : ව: 1948 | ........................... |
| **D** | ශක වර්ෂ වල ආරම්භය සිදුවීම | ක්‍රි : ව: 78 | ........................... |

(ල. 4)

iii. පෘථිවියේ ජීවය ඇතිවීම පිළිබඳ පහත ප්‍රකාශ කියවා ගැලපෙන ප්‍රකාශ යුගල යා කරන්න.

1. පෘථිවිය දූවිලි වලාවකින් නිර්මාණය වීම — A ඔපබිනියා
2. ආහාර ගැනීමට මුඛයක් සහ ඇස් පහක් තිබීම — B සිලූරියන්
3. ගොඩබිම පළමුවරට හැකරුල්ලන් වැනි සතුන් බිහිවූ යුගය — C පේලියෝ සොයික
4. ගොඩබිම ශාක බිහි වූ යුගය — D නිහාරිකාවන් (ල. 4)

iv. A පින්තූරයේ දැක්වෙන්නේ කුමක්ද?

B මෙම සළකුණ සොයාගත් රට කුමක්ද?

C මෙම සතා ජීවත් වූවා යැයි සැලකෙන්නේ කුමන ස්ථානයකද?

D මෙම සතාගේ ශරීර ලක්ෂණයක් ලියන්න.



(ල. 4)

02. මිනිසාට තිබූ පහත සඳහන් හැකියා හැඳින් වූ ආකාරය එම හැකියා ඉදිරියෙන් ලියා දක්වන්න.

i. A අදහස් හුවමාරු කිරීම ....................................................

B නැටීම, ගැයීම වැනි සෞන්දර්යාත්මක ක්‍රියා .......................... (ල. 2)

ii. ගින්දර භාවිතයට හුරුවීමත් සමඟ මිනිසා ලබාගත් ප්‍රයෝජන 3 ක් දක්වන්න.

✠ ...................................... ✠...................................... ✠......................................

iii. පින්තූරය ඇසුරින් පිළිතුරු සපයන්න.



(අ) මෙම පින්තූරයේ දැක්වෙන්නේ කුමක්ද? (ල. 2)

(ආ) මෙය කුමන යුගයක පිහිටුවන ලද්දක්ද? (ල. 2)

(ඇ) මෙය නිර්මාණය කළේ කුමන ද්‍රව්‍යයකින්ද? (ල. 2)

(2x3=6)

03. i. පහත සඳහන් ප්‍රකාශ අතරින් පූර්වශිලා යුගයට අයත් අංග 2 ක් තෝරා ලියන්න.

A මිනිසුන් කණ්ඩායම් ලෙස එළිමහනේ ජීවත් වීම

B එක් තැනක දිගුකාලයක් ජීවත් වීමට හුරුවීම

C ගොවිතැනට පුරුදු වීම

D මළගිය ඥාතීන් වෙනුවෙන් අවමංගල චාරිත්‍ර පැවැත්වීම (ල 2)

ii. මධ්‍ය ශිලා යුගයේ මිනිසුන් පහත සඳහන් ක්‍රියාකාරකම් කිරීමට යෙදූ ශිල්පක්‍රම අදාළ ක්‍රියාකාරකම් ඉදිරියෙන් ලියන්න.

| | ක්‍රියාකාරකම | ශිල්ප ක්‍රමය |
|---|---|---|
| A | ආහාර සපයා ගැනීම | .................................. |
| B | නිවාස තැනීම | .................................. |
| C | චිත්‍ර නිර්මාණය | .................................. |

(ල - 3)

iii. නව ශිලා යුගය ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A නව ශිලා යුගයේ මිනිසා ගල් මෙවලම් වෙනුවට භාවිතා කළ මෙවලම් නම් කරන්න. .................................... (ල - 2)

B එකතැන ජීවත් වීමට හුරුවීම නිසා බිහි වූ දෙයක් නම් කරන්න. ................................................ (ල - 2)

C සතුන්ගේ ආරක්ෂාව සඳහා කළ දෙයක් ලියන්න. (ල - 2)

(ල.2 x 3=6)

04. i. පහත සඳහන් ධාන්‍ය මුල්වරට වගා කළ ප්‍රදේශ සඳහන් කරන්න.

| ධාන්‍ය වර්ගය | වගාකළ ප්‍රදේශය |
|---|---|
| බඩ ඉරිඟු | .................................. |
| තිරිඟු | .................................. |
| වී | .................................. |

(ල.3)

ii. මිනිසා ගොවිතැනට හුරු වීම නිසා ඇති වූ වෙනස්කම් 2 ක් ලියන්න. (ල - 2)

iii. ගොවිතැන් කළ මිනිසා අස්වැන්න නෙලා ගත් පසු ගත කළ විවේක කාලයේදි කළ කාර්යයන් 3 ක් ලියන්න.

(ල. 3x2=6)

05. i. හෝමෝ සේපියන් මානවයා විවිධ රටවලට ව්‍යාප්ත වීමේදී විවිධ හැඩරුව ගන්නා ලදී.

පහත සඳහන් ලෝක සිතියම හා මානව වර්ගවල පින්තූර උදව් කරගෙන ඔවුන් ව්‍යාප්ත වූ රටවල් ඊතල මඟින් සම්බන්ධ කරන්න.





කොකසොයිඩ්


නීග්‍රොයිඩ්


ඔස්ට්‍රලොයිඩ්


මොන්ගොලොඩ් (ල. 4)

ii. පහත සඳහන් වන්නේ ජලයේ බිහි වූ ජීවින් ගොඩබිමේදී විවිධ සතුන් ලෙස වර්ධනය වූ ආකාරයයි. එම සත්ව වර්ග අදාළ පින්තූර වලට ගැලපෙන පරිදි යා කරන්න.

| |
|---|
| පක්ෂීන් |
| උරගයන් |
| මත්ස්‍යයන් |
| කෘමීන් |
| පණුවන් |
| උභය ජීවීන් |
| ක්ෂිර පායින් |




(ල - 7)

06. i. පෘථිවියේ මහා හිමයුගය අවසන් වීම නිසා ගොවිතැනට හුරුවීමට පටන්ගත්තේ හෙලෝසීන යුගයේය. මේ යුගයේ සිදු වු වෙනස්කම් 3 ක් ලියන්න. (ල=3)

ii. මුල්කාලයේ ඉදිකළ ගෙවල් හැඳින්වූයේ වරිච්චි ගෙවල් ලෙසය. එම ගෙවල් වල ලක්ෂණ 2 ක් ලියන්න. (ල=4)

iii. පින්තූරයේ දැක්වෙන්නේ මිනිසා නිර්මාණය කළ තාවකාලික පැල්පතකි.

(අ) මෙය නිර්මාණය කළ යුගය කුමක්ද? (ල=2)

(ආ) එය නිර්මාණය කළේ කුමන ද්‍රව්‍ය වලින්ද? (ල=2)






07. i. දෙන ලද හරස්පද උපයෝගි කරගෙන පින්තූර ප්‍රහේලිකාව පුරවන්න.

හරහට :- 1. සාරවත් දේ නිපද වු මානවයා

2. ගින්දර නිපද වු මානවයා

3. මොහු විශාල සතුන්ගේ ඇටකටු භාවිතා කර නිවාස තැනවීය

පහළට :- 1. ගලකින් ගලකට ගසා පතුරක් කඩාගෙන ගල් මෙවලම් සෑදූ මානවයා

2. මිනිසෙකු වීමට නැඹුරුවක් ඇති කළ පැරණිතම වානරයා

ii. පහත සඳහන් හැකියාවන් තිබූ මානවයන් දෙදෙනා නම් කර එම නම් ඉදිරියෙන් ඔවුන්ගේ හැකියා ලියා දක්වන්න.

a. අදහස් හුවමාරු කිරීමට භාෂාව භාවිතා කිරීම

b. හැඟීම් ප්‍රකාශයට සංගීතය, චිත්‍ර, නැටුම් වැනි ක්‍රියාවල යෙදීම

c. දඩයක්කාරයකු වීම (ල - 6)